# ජාතික රාජ්‍ය සභාවේ
# 1974 අංක 7 දරන
# මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 01 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1974 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 01 වන දින]

එල්.ඩී.—ඕ. 74/72

1971 අංක 38 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 38 දරන මුදල් පනතේ 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 28අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :— — 1971 අංක 38 දරන පනතෙහි 28අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ආදායම් බලපත්‍ර සඳහා ඉල්ලීම ඉදිරිපත් කළ යුත්තේ යම් දිනයකට පෙර ද ඒ දිනය අමාත්‍යවරයා විසින් නිවේදනයක් මගින් වෙනස් කළ හැකි බව.

28අ. මෝටර් වාහන පනතේ 30(1)(ඉ) වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද යම් වර්ෂයක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීම පිණිස ඉල්ලීම් ඉදිරිපත් කළ යුත්තේ යම් දිනයකට පෙර ද එකී වර්ෂය වෙනුවෙන් එකී දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කළ හැකි ය. මේ වගන්තියේ "අමාත්‍යවරයා" යන්නෙන් අග්‍රාමාත්‍යවරයා විසින් ප්‍රවාහන විෂයය භාර කරනු ලැබ සිටින අමාත්‍යවරයා අදහස් වේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නියමිත දිනයෙහි දී බලපත්‍ර ගාස්තු ගෙවීම පැහැර හැරීම වෙනුවෙන් සියයට දහයක දඩ මුදලක් අය කිරීම.

29. මෝටර් වාහන පනතේ කවර විධිවිධානයක් තිබුණ ද ඒ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ අය විය යුතු යම් බලපත්‍ර ගාස්තුවක් ඒ පනත යටතේ හෝ 28අ වන වගන්තිය යටතේ වූ නිවේදනයක් යටතේ එය අය විය යුතු වන දිනයෙහි දී හෝ ඒ දිනයට පෙර සම්පූර්ණයෙන් ගෙවනු නොලැබුවහොත් ඒ බලපත්‍ර ගාස්තු ප්‍රමාණයෙන් සියයට දහයක් වූ ප්‍රමාණයක දඩ මුදලක් අයකර එකතු කර ගත යුතුය.".

4. මේ පනතේ 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ කරනු ලබන සංශෝධනය ඒ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයෙහි වලංගුව පැවති ලෙස සියලු ම කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය. — සංශෝධනය අතීතයට බලපාන බව.

2—ඒ 04747—11,425 (74/4)